11 ශ්‍රේණිය | 11 | S | I

# දෙවන වාර පරීක්ෂණය - 2018 ජූලි

## බුද්ධ ධර්මය - I

කාලය පැය 01 යි.

- උපදෙස් :- (i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  (ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න. සපයා ඇති පිළිතුරු ලියන පත්‍රයේ ප්‍රශ්න අංකයට අදාළ පිළිතුරු අංකය ඇති කවය තුළ (x) ලකුණ යොදන්න.
  (iii) මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ගණන 40 කි.

---

(01) ගිහි බෞද්ධයන් විසින් රැකිය යුතු නිත්‍ය සීලය වන්නේ,
1. පංච සීලයයි
2. අෂ්ටාංග සීලය යි
3. දස සීලයයි
4. ආජීවක අෂ්ටමක සීලයයි

(02) තමා විසින් ම පිළිපැද ඇස්පනාපිටම, මෙලොවදීම ප්‍රතිඵල දැකගත හැකි වීම අයත් වන්නේ ධර්ම රත්නයේ,
1. ස්වාක්ඛාත ගුණයයි
2. සන්දිට්ඨික ගුණයයි
3. ඒහි පස්සික ගුණයයි
4. අකාලික ගුණයයි

(03) පාරමිතා පිරීමේ දී ජීවිතයම පරිත්‍යාග කරමින් බෝසත් ගුණධර්ම සම්පූර්ණ කිරීම,
1. ආරම්භක ධාතු නම් වේ.
2. නික්ඛම ධාතු නම් වේ.
3. උපපාරමී නම් වේ.
4. පරමත්ථ පාරමී නම් වේ.

(04) බුදු දහමෙහි පැවසෙන ආකාරයට දැහැමි රැකියාවක නිරත වීම අයත් වන්නේ,
1. සම්මා වාචා
2. සම්මා කම්මන්ත
3. සම්මා ආජීව
4. සම්මා වායාම

(05) "ලෝකයේ සාමාන්‍ය මිනිසුන් රාගයෙන් රාගයටත්, ද්වේශයෙන් ද්වේශයටත්, මෝහයෙන් මෝහයටත් ගමන් කරති"මෙය,
1. අනුසෝතගාමී ස්වභාවයයි.
2. පටිසෝතගාමී ස්වභාවයයි.
3. නිර්වාණගාමී ස්වභාවයයි.
4. අනාගාමී ස්වභාවයයි.

(06) අටලෝ දහමින් කම්පා නොවීම මංගල කරුණක් බව සඳහන් වන සූත්‍ර පාඨය වන්නේ,
1. පතිරූප දේස වාසෝච - පුබ්බේච කතපුඤ්ඤතා
2. ඵුට්ඨස්ස ලෝක ධම්මේහි - චිත්තං යස්සන කම්පති
3. තපෝච බ්‍රහ්මචරියංච - අරියසච්චාන දස්සනං
4. මාතා පිතු උපට්ඨානං - පුත්තදාරස්ස සංගහො

(07) "චේතනාහං භික්ඛවෙ කම්මං වදාමි." මෙම විවරණය අනුව කිසියම් ක්‍රියාවක් කර්මයක් වීම සඳහා,
1. චේතනාව අත්‍යවශ්‍ය වේ.
2. කුසලය අත්‍යවශ්‍ය වේ.
3. දෘෂ්ටිය අත්‍යවශ්‍ය වේ.
4. අකුසලය අත්‍යවශ්‍ය වේ.

(08) අනුරාධපුර බුද්ධශ්‍රාවක විශ්වවිද්‍යාලය මගින් රේරුකානේ හිමි වෙත ප්‍රදානය කරන ලද්දේ,
1. සම්මාන පණ්ඩිත ගෞරව නාමය
2. ප්‍රවචන විශාරද සම්මාන උපාධිය
3. මහාචාර්ය පදවිය
4. අමරපුර මහා මහෝපාධ්‍යාය ශාසන ශෝභන ගෞරව නාමය

(09) සිතෙහි පවතින නොසන්සුන් විසිරුණු ගතිය උද්ධච්ච කුක්කුච්චයයි. එය සිරගෙයක දුක් විඳින්නකුට සමානකර දක්වා ඇත්තේ,
1. අග්ගඤ්ඤ සූත්‍රයෙහි.
2. සාමඤ්ඤඵල සූත්‍රයෙහි.
3. චූළහත්ථිපදෝපම සූත්‍රයෙහි.
4. වේළුද්වාර සූත්‍රයෙහි.

(10) පොත පත කියවීමෙන් හා සවන්දීමෙන් ඇතිකර ගනු ලබන ප්‍රඥාව හඳුන්වනු ලබන්නේ,
1. සීලමය ප්‍රඥා 2. චින්තාමය ප්‍රඥා 3. භාවනාමය ප්‍රඥා 4. සුතමය ප්‍රඥා

(11) රෝගී වූවන් සොයා යන ගමනේ දී, බුදුරජාණන් වහන්සේ සත්තබොජ්ඣංගය දේශනාකොට රෝගය සුවපත් කරනු ලැබුවේ.
1. මුගලන් මහරහතන් වහන්සේ 2. පූතිගත්තතිස්ස තෙරුන්
3. මහා කාශ්‍යප මහරහතන් වහන්සේ 4. වච්ඡිගොත්ත තෙරුන්

(12) 'දර ඇති කල ගිනි ඇත, දර නැති කල ගිනි නැත' බුදුරජාණන් වහන්සේ මෙයින් පැහැදිලි කර ඇත්තේ,
1. තාදී ගුණය පිළිබඳව ය. 2. හේතුඵල සම්බන්ධය පිළිබඳව ය.
3. දිළිඳුකම පිළිබඳව ය. 4. ගැටලු නිරාකරණය පිළිබඳව ය..

(13) වැසිකිළි පරිහරණයේ දී බඳුනේ ජලය ස්වල්පයක් ඉතිරි කිරීම මුල්කොටගෙන ඇතිවූ කලහකාරී සිදුවීමේ දී වැරැද්ද තේරුම් ගැනීමට ඉඩ සලසා බුදුරජාණන් වහන්සේ වැඩම කළේ,
1. අනුපිය අඹ වනයට ය. 2. මේඝිය වනයට ය.
3. ගිජ්ඣකූට පර්වතයට ය. 4. පාරිලෙය්‍යය වනයට ය.

(14) බෝසතාණන් වහන්සේ ප්‍රඥා පාරමිතාව සහ සීල පාරමිතාව පිරූ ආකාරය පැහැදිලි වන ජාතක කතා වන්නේ,
1. උම්මග්ග ජාතකය හා වණ්ණුපථ ජාතකය යි. 2. උම්මග්ග ජාතකය හා ලෝමහංස ජාතකය යි.
3. තේමිය ජාතකය හා මඝමානවක ජාතකය යි. 4. උම්මග්ග ජාතකය හා සීලවීමංස ජාතකය යි.

(15) අභිධ්‍යාව, ව්‍යාපාදය, මිථ්‍යාදෘෂ්ටිය අයත් වන්නේ,
1. කුසල කර්මවලට යි. 2. කාය කර්මවලටයි.
3. මනෝ කර්මවලටයි. 4. වචී කර්මවලටයි.

(16) බුදුරජාණන් වහන්සේගේ රූප සම්පත්තිය, බාහිර පෞරුෂය කෙරෙහි ඇති වූ ප්‍රසාදය හේතුවෙන් බුදුන්වහන්සේ අනුගමනය කළේ,
1. වක්කලී හිමියන් 2. සුභද්‍ද හිමියන් 3. ස්වර්ණකාර හිමියන් 4. ධර්මාරාම හිමියන්

(17) සම්බුදු දහම ඇතුළත් ත්‍රිපිටක දේශනාවෙහි, ධම්ම පදය අයත් වන්නේ,
1. මජ්ඣිම නිකාය 2. ඛුද්දක නිකාය 3. අංගුත්තර නිකාය 4. සංයුක්ත නිකාය

(18) රාජ්‍ය පාලනයේ දී තමාට ඇති නෑදෑකම, හිතවත්කම, සලකා වැඩකටයුතු සිදුකර දීම රැකියා ලබා දීම,
1. භය නිසා අගතියට යාමකි. 2. මෝහය නිසා අගතියට යාමකි.
3. ඡන්දය නිසා අගතියට යාමකි. 4. ද්වේශය නිසා අගතියට යාමකි.

(19) "ඉමස්මිං සති ඉදං හෝති" යන පාඨයේ අදහස නිවැරදිව දක්වා ඇත්තේ,
1. මෙය නැති කල්හි මෙය නූපදී යන්නයි. 2. මෙය ඇති කල්හි මෙය නූපදී යන්නයි.
3. මෙය ඉපදීමෙන් මෙය උපදී යන්නයි. 4. මෙය ඇති කල්හි මෙය වෙයි යන්නයි.

(20) "වෙජ්ජුපටො ජිනවරො" සත්හට වනබව දුකට වෙදාණන් යනුවෙන් බුදුහිමි හඳුන්වා ඇත්තේ,
1. ලෝවැඩ සඟරාවෙහි ය. 2. සාරාර්ථ සංග්‍රහයෙහි ය.
3. ගුත්තිල කාව්‍යයෙහි ය. 4. බුදුගුණ අලංකාරයෙහි ය.

(21) යම් ක්‍රියාවක විපාකය කඳුළු පිරි මුහුණින් යුතුව අඬමින් විඳින්නට සිදුවේ ද එවැනි ක්‍රියා නොකිරීම යහපත් බව දැක්වෙන ගාථා පාඨය වනනේ,
1. නතං කම්මං කතං සාධු...... 2. අත්තනාව කතං පාපං......
3. සුකරානි අසාධූනී...... 4. උට්ඨානවතෝ සතිමතෝ.......

(22) 'ස්ථිර නොවෙනස්වන මම මගේ යැයි ගත හැකි පදාර්ථයක් නැත' යන අදහස උගන්වන්නේ,
1. දුක්ඛ ලක්ෂණයෙනි. 2. අනිත්‍ය ලක්ෂණයෙනි.
3. අනාත්ම ලක්ෂණයෙනි. 4. භෞතික ලක්ෂණයෙනි.

(23) සිත් සතන් පිනවන සියලු ගුණවලින් තමන් වහන්සේට සමාන වූ හෝ වැඩි වූ හෝ සත්වයන් සදාකල්හිම ලෝකයේ නැති නිසා බුදුරජාණන් වහන්සේ මේ නමින් හැඳින්වේ.

1. සත්ථා දේවමනුස්සානං
2. සුගත
3. ලෝකවිදූ
4. අනුත්තර

(24) වැලිවිට අසරණ සරණ සිරි සරණංකර හිමිපාණන් වහන්සේට සංඝරාජ පදවිය පිරිනමන ලද්දේ,

1. I අග්බෝ රජතුමා
2. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා
3. මහසෙන් රජතුමා
4. II පැරකුම්බා රජතුමා

(25) බුදුරජාණන් වහන්සේ සිව්වන වස් කාලය ගත කරන ලද්දේ,

1. වේළුවනාරාමයේ
2. චාලිය පර්වතයෙහි
3. ජීවක අඹ උයනෙහි
4. බරණැස ඉසිපතනයෙහි

(26) දැනට හමු වී ඇති වාහල්කඩ අතුරින් කලාත්මක අතින් උසස්ම වාහල්කඩ හමු වී ඇත්තේ,

1. රත්න ප්‍රාසාදයෙන්
2. මිහින්තලේ කණ්ඨක චෛත්‍යයෙන්
3. අනුරාධපුර බිසෝ මාලිගාවෙන්
4. කුරුණෑගල නිල්ලක්කම ප්‍රදේශයෙන්

(27) සිඟාලෝවාද සූත්‍රයේ දී හිතමිතුරන් දක්වා ඇති දිශාව වන්නේ,

1. බටහිර දිශාව
2. දකුණු දිශාව
3. උතුරු දිශාව
4. නැගෙනහිර දිශාව

(28) මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයා මරණාසන්න මොහොතේ දී බුදුන්දැක සිත පහදවා ගත් පිනෙන් දෙව්ලොව ඉපදුණේ ය. ඒ සඳහා බලපාන ලද්දේ,

1. ආචිණ්ණ කර්මයයි.
2. ගරුක කර්මයයි.
3. කටත්තා කර්මයයි.
4. ආසන්න කර්මයයි.

(29) සීලයෙහි පිහිටා කටයුතු නොකිරීම නිසා සියලු ධන සම්පත් අහිමි කරගෙන ඉණ ඇඳි වතට පමණක් සීමා වූ අයෙකු ලෙස දැක්වෙන්නේ,

1. අජාසත් රජතුමා
2. කාල සිටුපුත්
3. මහධන සිටුපුත්‍රයා
4. කුම්භඝෝෂක

(30) සළායතන හේතුකොටගෙන ස්පර්ශ ඇතිවේ. එනම් උපාදාන හේතුකොටගෙන ඇතිවන්නේ,

1. භවය
2. විඤ්ඤාණය
3. තණ්හාව
4. නාමරූප

(31) අස්සජි මහරහතන් වහන්සේ විසින් උපතිස්ස පිරිවැජිතුමාට දේශනා කරන ලද්දේ,

1. මනෝ පුබ්බංගමා ධම්මා.............. යන්නයි.
2. අප්පමාදෝ අමතපදං............. යන්නයි.
3. අනිච්චා වත සංඛාරා......... යන්නයි.
4. යේ ධම්මා හේතුප්පභවා...........යන්නයි.

(32) මුවදෙව්දාවත යන ග්‍රන්ථය සඳහා වස්තු විෂය කරගෙන ඇත්තේ,

1. සස ජාතකය
2. කුස ජාතකය
3. මඛාදේව ජාතකය
4. වෙස්සන්තර ජාතකය

(33) තමා අතින් සිදු වූ වරදකට තමාටම දඬුවම් කර ගැනීම සඳහා දුටුගැමුණු රජතුමා විසින් සාදවන ලද්දේ,

1. රුවන්වැලිසෑය
2. ථූපාරාමය
3. අභයගිරිය
4. මිරිසවැටිය

(34) 'මෙවන් පුතකු ලද මවක් පියෙක් නිවුණෝ වෙති. මෙවන් සැමියෙකු ලද භාර්යාවක් නිවුණෝ වෙති.' යනුවෙන් නිබ්බුත පද ප්‍රකාශ කරන ලද්දේ,

1. සුමනා විසිනි
2. ප්‍රජාපතී ගෝතමිය විසිනි
3. සුජාතා විසිනි
4. කිසා ගෝතමිය විසිනි

(35) මමත්වය නිසා මසුරුකම ඇති වේ. මසුරුකම නිසා ආරක්ෂා කිරීම් ඇති වේ. ආරක්ෂා කිරීම නිසා කලකෝලාහල, විවාද, බොරුකීම ඇති වේ. මෙසේ තණ්හාව නිසා කලකෝලාහල ඇතිවන බව පෙන්වා දී ඇත්තේ,

1. තේවිජ්ජ සූත්‍රයේ ය.
2. මහා නිදාන සූත්‍රයේ ය.
3. ආසිවිසෝපම සූත්‍රයේ ය.
4. අනත්ත ලක්ඛන සූත්‍රයේ ය.

(36) අනුන්ගේ සැපත දැක සතුටු වන පුද්ගලයාට ලැබෙන විපාකය වන්නේ,

1. නිරෝගීව ඉපදීමයි.
2. රූමත්ව ඉපදීමයි.
3. යසස් ඇතිව ඉපදීමයි.
4. ප්‍රඥාවන්තව ඉපදීමයි.

(37) අනුභව කරන ලද ආහාර වමාරා දමා නැවතත් ආහාර ගන්නා තරමට ගිජු වූ පුද්ගලයා හඳුන්වනු ලබන්නේ,

1. කාකමාසක
2. භුත්තවමික
3. තත්ථවට්ටක
4. අලංසාටක

(38) හතරවන සංගායනාව සිදුකරන ලද්දේ මාතලේ අළුවිහාරයේ දී. ඒවන විට ලක්දිව රජ කළේ,

1. දෙවන පෑතිස්ස රජු
2. දුටුගැමුණු රජු
3. මහසෙන් රජු
4. වළගම්බා රජු

(39) කැලණි රජමහා විහාරයේ චෛත්‍යය අයත් වන්නේ,

1. ධාන්‍යාකාර හැඩයට ය.
2. ඝණ්ඨාකාර හැඩයට ය.
3. බුබ්බුලාකාර හැඩයට ය.
4. ඝටාකාර හැඩයට ය.

(40) ස්වාභාවික පරිසරය දම්සභා මණ්ඩප බවට පත්කරගත් බුදුරජාණන් වහන්සේ කසී භාරද්වාජ සූත්‍රය දේශනා කරන ලද්දේ,

1. කලන්දක නිවාපයේ දී
2. කෙත් යායකදී
3. අචිරවතී නදී තීරයෙහි පිහිටි අඹ වනයේ දී
4. මකුල පර්වතයෙදී

**II ශ්‍රේණිය** | 11 | S | II

# දෙවන වාර පරීක්ෂණය - 2018 ජූලි

## බුද්ධ ධර්මය - II

කාලය පැය 02 යි.

- පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20ක් හා අනෙක් එක් එක් ප්‍රශ්නයට ලකුණු 10 බැගින් හිමි වේ.

(01) 1. සිව්පසයෙන් 2ක් නම් කරන්න.
2. විශේෂ පුද්ගලයකු හෝ පිරිසක් අරභයා පිහිටවීමට වැඩම කිරීම හඳුන්වන නම ලියන්න.
3. බුදුරජාණන් වහන්සේගේ පුරිසධම්ම සාරථී ගුණය ප්‍රකට කෙරෙන අවස්ථා 2ක් දක්වන්න.
4. ජේතවනාරාමය හා පූර්වාරාමය සාදවා බුදුසසුනට පූජා කළ අය දක්වන්න.
5. භාවනාව බෙදෙන කොටස් 2 නම් කරන්න.
6. මෙලොව දියුණුව පිණිස හේතුවන කරුණුවලින් 2ක් දක්වන්න.
7. ගිහිජීවිතය සාර්ථක කර ගැනීම සඳහා වැදගත් කරුණු සපයන සූත්‍ර දේශනා 2ක් දක්වන්න.
8. සතර සංග්‍රහ වස්තුවලින් 2ක් දක්වන්න.
9. ජලය පරිහරණය කිරීමේ දී අප විසින් නොකළ යුතු කරුණු 2ක් දක්වන්න.
10. සතර මහා භූතයන්ගෙන් 2ක් දක්වන්න.

(02) 1. තුන්තරා බෝධිය නම් කරන්න.
2. බුද්ධ කාරක ධර්ම සම්පූර්ණ වීමට තිබිය යුතු ලක්ෂණ අතුරින් 3ක් ලියන්න.
3. බෝසතාණන් වහන්සේ සත්‍ය පාරමිතාව පිරූ ආකාරය ''වට්ටක ජාතකයෙන්'' දැක්වේ. ඔබ සත්‍ය පාරමිතාව පුරන්නෙකු වශයෙන් කටයුතු කරන ආකාරය පහදන්න.

(03) 1. මත් වතුර හා මත් ද්‍රව්‍ය භාවිතය නිසා පුද්ගලයා මුහුණ දෙන අනිසි විපාක 2ක් දක්වන්න.
2. ''කාලා රසමුසු හෝජන කර පෙම්...'' යන කවියේ ඉතිරි පද සම්පූර්ණ කරන්න.
3. පන්සිල් සුරැකීම සාමකාමී සමාජයකට මග පාදයි. ඔබ කැමති එක් ශික්ෂාපදයක් ඇසුරින් මේ කියමන සනාථ කරන්න.

(04) 1. අනගාරික ධර්මපාලතුමා ඉතාමත් විරුද්ධව කටයුතු කළේ කුමක් පිළිබඳව ද?
2. අනගාරික ධර්මපාලතුමා පහළ වන විට මෙරට විවිධ ජාතීන්ට යටත් වී තිබුණි. එලෙස යටත්ව තිබූ ජාතීන් තුනක් දක්වන්න.
3. අනගාරික ධර්මපාලතුමා විසින් සිදුකළ ලෝක ශාසනික සේවය අති විශාල ය. විමසන්න.

(05) 1. ලෝකය හා ජීවිතය පිළිබඳ ඇතිකර ගත් අවබෝධය දෙයාකාරය, දක්වන්න.
2. පංචනීවරණවලින් තුනක් තේරුම සහිතව දක්වන්න.
3. නිවන් මග අහුරන පංචනීවරණ ධර්ම ශිෂ්‍ය ජීවිතයේ දී මාරයකු වැනි ය. විමසන්න.

(06) 1. උට්ඨානවතෝ සතිමතො................. යන ගාථාව සම්පූර්ණ කරන්න.
2. එහි අදහස ලියා දක්වන්න.
3. පුද්ගල දියුණුව සඳහා මෙම ගාථාවේ ඇතුළත් කරුණු උපයෝගී කර ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

(07) පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
1. රේරුකානේ චන්දවිමල හිමි
2. දසපාරමිතා
3. සමථ භාවනාව
4. ධම්ම පදය